# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2383/44 - 2024 මැයි මස 10 වැනි සිකුරාදා - 2024.05.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 94/47 (IX)

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6(2)(ආ) වගන්තිය සහ 21(2)(ආ) වගන්තිය යටතේ වන නියමය

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2)(ආ) වගන්තිය සහ 21(2)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, මේ නියමය මගින්, -

(1) ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති "කළල්පිටිය ක්ෂේත්‍රාරාම පුරාණ විහාර පූජා භූමි ප්‍රදේශය" යනුවෙන් හඳුන්වනු ලබන භූමි ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත්කරනු ලැබේ; සහ

(2) නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ඉහත ප්‍රකාශයට පත් කරනු ලැබූ "කළල්පිටිය ක්ෂේත්‍රාරාම පුරාණ විහාර පූජා භූමි ප්‍රදේශය" සඳහා පරිබාහිර සැලැස්මක් සකස් කළ යුතු බවට විධාන කරනු ලැබේ.

**ප්‍රසන්න රණතුංග,**
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2024 මැයි මස 09 වැනි දින,
කොළඹ දී ය.

1A - G 41920 — 09 (2024/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

### කළල්පිටිය ක්ෂේත්‍රාරාම පුරාණ විහාර පූජා භූමිය සංයුක්ත වන භූමි ප්‍රදේශය

මධ්‍යම පළාතේ, මාතලේ පරිපාලන දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක ඊ357ඒ, කළල්පිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කළල්පිටිය ග්‍රාමයේ පිහිටි "විහාරයේ වත්ත සහ බෝමළුවේ වත්ත" යනුවෙන් හඳුන්වනු ලබන භූමියේ සර්වේයර් ජනරාල්වරයාගේ අංක එම්.ඒ/යූ.කේ.ඩබ්ලිව්/2024/90 දරන, 2024 අප්‍රේල් මස 02 වන දිනැති අනුරේඛනයේ නිරූපිත පරිදි වූ, කැබලි අංක ඒ (1.1772) සහ කැබලි අංක බී (0.2936) සංයුක්ත වන හෙක්ටයාර 1.4708 ක විශාලත්වයෙන් යුක්ත, පහත දැක්වෙන පරිදි මායිම් වූ ප්‍රදේශයඃ-

**කැබලි අංකඃ ඒ** - විහාරයේ වත්ත සහ බෝමළුවේ වත්ත

*උතුරට* : එන්.ජී.ටී. සෙනෙවිරත්න හිමිකම් කියන මඩපුරේ යාය, ක්ෂේත්‍රාරාම පුරාණ විහාරය හිමිකම් කියන ඇත්වල පහුර, සර්වේයර් ජනරාල්වරයාගේ අංක එම්.ඒ/යූ.කේ.ඩබ්ලිව්/2024/90 දරන අනුරේඛනයේ කැබලි අංක 'බී', 'ඊ' සහ 'එෆ්', එන්. ජී. වූලරත්න හිමිකම් කියන ඔලියන්ගේ කුඹුර, කේ. ජී. ගුණරත්න හිමිකම් කියන ඔලියන්ගේ කුඹුර, ඩබ්. ඩබ්. රත්නසූරිය හිමිකම් කියන ඔලියන්ගේ කුඹුර, එස්. ඩී. ආර්. මල්වැන්න හිමිකම් කියන ඔලියන්ගේ කුඹුර, ඩී. ජී. චන්ද්‍රසිරි හිමිකම් කියන වෙලේගෙදර වත්ත;

*නැගෙනහිරට* : එන්. ජී. වූලරත්න හිමිකම් කියන ඔලියන්ගේ කුඹුර, කේ. ජී. ගුණරත්න හිමිකම් කියන ඔලියන්ගේ කුඹුර, ඩබ්. ඩබ්. රත්නසූරිය හිමිකම් කියන ඔලියන්ගේ කුඹුර, එස්. ඩී. ආර්. මල්වැන්න හිමිකම් කියන ඔලියන්ගේ කුඹුර, ඩී. ජී. චන්ද්‍රසිරි හිමිකම් කියන වෙලේගෙදර වත්ත, ඩබ්. ඩී. චන්ද්‍රසිරි හිමිකම් කියන තැන්නරා පැල සහ ක්ෂේත්‍රාරාම පුරාණ විහාරය හිමිකම් කියන දික් පැල;

*දකුණට* : ඩබ්. ඩී. චන්ද්‍රසිරි හිමිකම් කියන තැන්නරා පැල සහ ක්ෂේත්‍රාරාම පුරාණ විහාරය හිමිකම් කියන දික් පැල, සර්වේයර් ජනරාල්වරයාගේ අංක එම්.ඒ/යූ.කේ.ඩබ්ලිව්/2024/90 දරන අනුරේඛනයේ කැබලි අංක 'එෆ්', මාර්ගය, එම්. එම්. අශ්රෆ් හිමිකම් කියන දෙල්ගහ ලියද්ද සහ ඇළ; සහ

*බටහිරට* : එම්. එම්. අශ්රෆ් හිමිකම් කියන දෙල්ගහ ලියද්ද සහ ඇළ, එන්. ටී. ජී. සෙනෙවිරත්න හිමිකම් කියන මඩපරේ යාය සහ ක්ෂේත්‍රාරාම පුරාණ විහාරය හිමිකම් කියන ඇත්වල පහුර.

**කැබලි අංකඃ බී** - විහාරයේ වත්ත සහ බෝමළුවේ වත්ත

*උතුරට* : හි. පි. 55887 හි කැබලි අංක 2, මාර්ගය, සර්වේයර් ජනරාල්වරයාගේ අංක එම්.ඒ/යූ.කේ.ඩබ්ලිව්/2024/90 දරන අනුරේඛනයේ කැබලි අංක සී, ඩී සහ ඒ;

*නැගෙනහිරට* : සර්වේයර් ජනරාල්වරයාගේ අංක එම්.ඒ/යූ.කේ.ඩබ්ලිව්/2024/90 දරන අනුරේඛනයේ කැබලි අංක 'සී', 'ඩී' සහ 'ඒ';

*දකුණට* : සර්වේයර් ජනරාල්වරයාගේ අංක එම්.ඒ/යූ.කේ.ඩබ්ලිව්/2024/90 දරන අනුරේඛනයේ කැබලි අංක 'එෆ්', සහ 'ඒ'; සහ

*බටහිරට* : සර්වේයර් ජනරාල්වරයාගේ අංක එම්.ඒ/යූ.කේ.ඩබ්ලිව්/2024/90 දරන අනුරේඛනයේ කැබලි අංක "ඒ", ක්ෂේත්‍රාරාම පුරාණ විහාරය හමිකම් කියන ඇත්වල පහුර සහ හි. පී. 55887 හි කැබලි අංක 2.

EOG 05 - 0088

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.